# ඉපැරණි සංකේත ආශ්‍රයෙන් ගොඩනැගිය හැකි ශ්‍රී ලංකාවේ ආදි සන්නිවේදන සම්බන්ධතා

අශෝකා ශ්‍රියාණි සිරිවර්ධන

## ශ්‍රී ලංකාවේ සන්නිවේදනයේ හා ප්‍රකාශනයේ සමාරම්භය

ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදුකොට ඇති පුරාවිද්‍යා පර්යේෂණවලට අනුව ආදිතම ප්‍රාග් ඓතිහාසික දත්ත වාර්තාවන්නේ මධ්‍යපුරා ශිලා සමයෙනි (Middle Palaeolithic). බූන්දල, පතිරාජවෙල, උස්සන්ගොඩ, මිනිහාගල්කන්ද ආදි ප්‍රදේශවල සිදුකරනු ලැබූ කැනීම්වල දී මෙම අවධියට සම්බන්ධ මානව කෘතක සාධක (stone implement) හඳුනාගැනීමට හැකි වී තිබෙන අතර විකිරණමාන දින නියම කිරීම්වලට අනුව ඒවා අදින් වසර 74000 - 125000 අතර කාලයට අයත් බව හඳුනාගෙන ඇත (Deraniyagala: 1992; 2004). භූගෝලීය වශයෙන් සර්මකලාපිය දේශගුණය හේතුවෙන් මෙම කාල වකවානුවේ ජීවත් වූ මානවයා සම්බන්ධ සැකිලි සාධක හෝ ඔහුගේ ජීවනෝපාය හා සංස්කෘතික කටයුතු සම්බන්ධව පැවැති තත්ත්වයන් විනාශ වී ඇති බව පෙන්වා දෙන දැරණියගල ලංකාවේ වඩා නිශ්චිත ලෙස ප්‍රාග් ඓතිහාසික සංස්කෘතික තොරතුරු හඳුනාගත හැක්කේ මධ්‍යශිලා අවධියෙන් බව පෙන්වා දෙයි (ibid). ලංකාවේ මෙසොලිතික සංස්කෘතිය එසේත් නැතහොත් බලංගොඩ සංස්කෘතික සමයේ විසූ මිනිසුන් සන්නිවේදනය සම්බන්ධ ක්‍රියාදාමයන් දැන සිටි බවට විශ්වාස කළ හැකි සාක්ෂි විශාල ප්‍රමාණයක් ලැබෙන අවධිය වේ. වියළි කලාපයේ හා තෙත් කලාපයේ සමහර ගල් ගෙවල්වල සිදුකරනු ලැබූ පර්යේෂණවලින් තහවුරු කර තිබෙනුයේ අදින් වසර 40000කට පෙර සිට ඇරඹි මෙම සංස්කෘතියේ විසූ මානවයා, හෙමටයිට්, (hematite) ලිමොනයිට්, (Limonite) මොලිව්ඩෙනම් (Molivedenum) නිල්මැටි හා පිඟන් මැටි භාවිත කර තිබේ (සෙනෙවිරත්න : 1996). බුලත්සිංහල ෆාහියන් ලෙනෙන් හමුවූ ගුරුගල් (Red Ocher) ආලේපිත මානව හිස්කබල් කොටස් හා රාවණාඇල්ල ගල්ගේ තුළින් හමු වූ ගුරුගල් ආලේපිත සැකිලි කොටස් මේ තත්ත්වය සනාථ කරන අතර මේවා

අනිවාර්යයෙන් ම තම සන්නිවේදන හා ප්‍රකාශන මාධ්‍ය වන චිත්‍ර හෝ කුරුටු සලකුණු ආදියේ දී භාවිත කරන්නට ඇතැයි අපට උපකල්පනය කළ හැකි ය.

## ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම්

ශ්‍රී ලංකාවේ ස්වාභාවික ගල්ලෙන්වල ප්‍රාථමික මානවයා අඳින්නට ඇතැයි ප්‍රබල ලෙස සැක කරනු ලබන රූ සටහන් අතර සත්ත්ව රූප, මිනිස් රූප, විවිධ ආයුධ වර්ග දැකගත හැකි ය.

සේනක බණ්ඩාරනායක පෙන්වා දෙන ආකාරයට ප්‍රාථමික මානවයා දඩයම් කරන සතුන් මෙසේ ගල් ගුහාවල වැඩි වශයෙන් ඇඳීමෙන් අදහස් කරන්නට ඇත්තේ ඒ සතුන්ගේ රූ නිතර තම නෙත ගැටීමෙන් ඒ සතුන් දඩයම සඳහා වැඩි වශයෙන් ලැබෙතැයි විශ්වාසය මත ය. මෙවැනි අදහස් ප්‍රකාශ කරන්නට ඇතැයි හැඟෙන්නේ ප්‍රාග් ඓතිහාසික කැනීම්වලින් හමුවන සත්ත්ව අක්ෂර අතර අලියාගේ සිට ලොකු කුඩා සතුන් බොහෝ ප්‍රමාණ ආහාරයට ගත් බවට සාධක ලැබෙන බැවිනි.

චිත්‍ර කලාව පිළිබඳ ව මූලික අදහස් ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා මානවයා දැන සිටි බවට ලැබෙන හොඳ ම නිදර්ශන වන්නේ ෆාහියන් ගල් ගුහාවෙන් හමු වූ මිනිස් හිස් කබල ගුරුගල් අඹරා ලබාගත් වර්ණවලින් කරන ලද ආලේප සහ රාවණා ඇල්ලෙන් හමු වූ තවත් මානව සැකිලි කොටස් ගුරුගල්වල පවතින වර්ණ ආලේප වෙයි (Deraniyagala: 1992). තව ද, ප්‍රාග් ඓතිහාසික මානව ජනාවාසවලින් ලැබෙන ඇඹරුම් ගල්වලින් මිනිරන් හා හුණු වර්ණ ඇඹරූ බවට සාධක ලැබීම වටිනා සිද්ධියකි.

ඇටකටුවල වර්ණාලේපය කිරීමෙන් ආරම්භ වූ ඒ කලා ඉතිහාසය සමග ක්‍රමානුකූල ව සන්නිවේදන මාධ්‍ය දක්වා සංකේතානුසාරයෙන් හා කුරුටු චිත්‍ර මඟින් ඉදිරිපත් කිරීම සම්බන්ධ සාධක මඩවල ලෙන, ගල්ඔය, සියඹලාණ්ඩුව, තන්තිරිමලේ, රාවණාඇල්ල, ගොනාගොල්ල, බුදුගල්ගේ, කොනත්තේගොඩ, ගනේගම, ආඬිගල්ගේ, බිල්ලෑව, දොරවක් කන්ද, බුදුගල, දිඹුලාගල, ලේනව, මණ්ඩාගල්ගේ, පිලිලේගොඩ ගල්ගේ, කඳුරුපොකුණ, බඹරගන්තලාව, ගනේගම, අළුගල්ගේ, ආඬියාගල, කුඩුම්බිගල, මලයාඩිකන්ද, උස්සාගල ආදි ස්ථානවලින් දැකගත හැකි ය (Bandaranayake : 1986; Nandadewa: 1986; Deraniyagala : 1958; බිනරගම : 2008). මේ ස්ථානවලින් හමුවන චිත්‍ර හා කුරුටු සංකේත ප්‍රාග් ඓතිහාසික අවධිය නියෝජනය කරන නිශ්චිත චිත්‍රදැයි විද්වතුන් අතර මතවාද කිහිපයක් පවතී. සේනක බණ්ඩාරනායක මේවා ප්‍රාග් ඓතිහාසික ගණයේ චිත්‍ර වශයෙන් සැලකීම යෝග්‍ය යැයි පවසා ඇත (Bandaranayake: 1986).


නන්දදේව විජේසේකර මේවා පසු කාලයේ කලාවට නෑකම් නොකියන බව ප්‍රකාශ කරයි. සිරාන් දැරණියගල ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ක්‍රමයක් ලංකාවේ නොපැවැති බව ප්‍රකාශ කරයි (Deraniyagala: 1986). මේ ආකාරයට නිශ්චිත කාල වකවානුවන් පිළිබඳ ව සාධක අපට ප්‍රාග් ඓතිහාසික සන්නිවේදනය ඇසුරෙන් ගොඩනැගිය නොහැකි ය. ප්‍රාග් ඓතිහාසික ගුහා තුළ පවතින්නා වූ ද ඉන් පසු ව ඇතිවෙන යුගවල දී සන්නිවේදනය සඳහා භාවිත කර ඇති සංකේත අතර සාම්‍යතාව ඒවා ප්‍රකාශන මාධ්‍යයක් ලෙස භාවිත කර ඇති බව සිතාගත හැකි ය.

මේ අන්දමට ප්‍රාග්ඓතිහාසික අවධියට අයත් ගුහාවල දැකගත හැකි සංකේත හා මානව සටහන් අතර පහත සඳහන් වන්නා වූ රූප ඉතා වැදගත් වේ. මේවායෙහි, හැඩ ලක්ෂණ හා සමානතා පසු කාලය දක්වා ම ව්‍යාප්ත වී තිබීම ප්‍රාග්ඓතිහාසික යුගයේ සිට අඛණ්ඩ ව සන්නිවේදන සංකේත ලෙසින් භාවිත වූ බවට සාක්ෂි සපයයි. තව ද මේ චිත්‍ර අක්ෂර හෝ කුරුටු අක්ෂර කලාව පසුකාලීන ව දේශීය සන්නිවේදන ඉතිහාසයේ ආරම්භයට බලපාන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

**ප්‍රාග් ඓතිහාසික අවධිය හා සම්බන්ධ අක්ෂර නොවන සන්නිවේදන සංකේත**

තන්තිරිමලේ 

බුදුගල්ගේ 

ගොනාගොල්ල 

කොනන්තේගොඩ 

තන්තිරිමලේ 

බුදුගල 

ආඬියාගල 

උස්සාගල 

(Seneviratne : 1984 ; Nandadewa : 1986)

## ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදනයේ අඛණ්ඩ පරිවර්තනය පිළිබිඹු වන මූල ඓතිහාසික අවධිය

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ මැදශිලා (බලංගොඩ) සංස්කෘතියට පසු ව මෙරට මුල්බැස ගත් සංස්කෘතිය වන්නේ මූල ඓතිහාසික (proto historic) සංස්කෘතියයි. ක්‍රි. පූ. 1000 - 300 අතර පැවතුණු මේ සංස්කෘතිය එතෙක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ප්‍රාග් ඓතිහාසික සංස්කෘතියෙන් කැපී පෙනෙන ලෙස වෙනස් වේ. බලංගොඩ සංස්කෘතිය අවශ්‍යයෙන් ම ක්‍රියාත්මක වූයේ පලවැල නෙළීම හා සත්ත්ව දඩයම මුල් කොටගත් ආර්ථිකයක් තුළ ස්වභාවික පරිසරය මත ය. ඉන් අනතුරු ව මෙරට කලඑළි බහින ප්‍රොටෝඓතිහාසික මනුෂ්‍යයා පරිසරය මත යැපීම වෙනුවට පරිසරය මෙල්ල කරමින් බහු සම්පත් යැපුම් රටාවක් ක්‍රියාත්මක කිරීම සඳහා යකඩ තාක්ෂණය භාවිත කිරීම කැපී පෙනේ. එහි දැකගත හැකි සුවිශේෂ ලක්ෂණ ලෙස තඹ හා යකඩ ඇතුළු අවශේෂ ලෝහ භාවිතය, වී ගොවිතැන, සත්ත්ව හා ශාක ගෘහාශ්‍රකරණය, ගැමි ජනපද පිහිටුවා ගැනීම, නිමි පබළු නිෂ්පාදනය, කළු මැටි බඳුන්, රතු මැටි බඳුන් හා කාලරක්ත වර්ණ මැටි බඳුන් නිෂ්පාදනය ආශ්‍රිත පිඟන් මැටි කර්මාන්තය, පිළිස්සීමෙන් පසු මැටි බඳුන්වල කුරුටු සංකේත යෙදීම හා ජල කළමනාකරණය වෙයි. මෙම සංස්කෘතිය උතුර, උතුරුමැද, වයඹ, උතුරු මලය රට, අග්නිදිග, නැගෙනහිර හා බටහිර පළාත්හි ක්‍රියාත්මක විය. ක්‍රි. පූ. 1200 දී පමණ දකුණු ඉන්දියාවේ වර්ධනය වන්නට වුණු මූලඓතිහාසික යකඩ සංස්කෘතිය ක්‍රි. පූ. 1000 දී පමණ මෙරට සංක්‍රමණය විය (Ragan : 1990).

මූලික ව වියළි තැනිතලා ප්‍රදේශවල වාසභූමි ඇතිකර ගත් ප්‍රොටෝඓතිහාසික ප්‍රජාව සමාජ ආයෝජනය වර්ධනය වීම සමඟ වියළි තැනිතලා භූමිවලින් ප්‍රසාරණය වෙමින් ලංකාව පුරා ම ව්‍යාප්ත වූහ. මේ කාලය වන විට මෙරට ජීවත් වූ මධ්‍යශිලා වැසියන් බොහෝ විට මේ මහා සංස්කෘතික ප්‍රවාහයට නතුවීමට ඉඩ පැවති බව උපකල්පනය කළ හැකි ය. සම්මිශ්‍රණය වීම සමඟ නව සංස්කෘතියක් මෙරට බිහිවීම මින් පසු පෙනෙයි. ප්‍රාග් හා මූල ඓතිහාසික ප්‍රජාවන්ගේ පරිවර්තනය දැක්වෙන්නේ එවකට භාවිත කරනු ලැබූ සන්නිවේදන සංකේත මගිනි. විශේෂයෙන් ම පුළුස්සනු ලැබූ මැටි මෙවලම්වල දැකගත හැකි (අක්ෂර නොවන) සංකේතවලින් සමහරක් ප්‍රාග් ඓතිහාසික ගුහාවල දක්නට ලැබෙන ඒවා ලෙස ය. කෙසේ වෙතත්, ඉතා විශ්වසනීය ලෙස අඛණ්ඩ සන්නිවේදන සම්බන්ධතාවත් මෙහි පැවතුණු බව විශ්වාස කළ හැකි ය (මැන්දිස් : 2004).

ශ්‍රී ලංකාවේ මූලඓතිහාසික අවධියට සම්බන්ධ ජනාවාස හා සුසාන ඇසුරින් විශාල සංකේත ප්‍රමාණයක් සුසාන හා ජනාවාස ස්ථාන 44කින් වාර්තා වී ඇත. (Seneviratne & Jayaratne : 2006). එයින් අති බහුතරයක් පියන්ගල් හා මැටි බඳුන්වලිනි. අනුරාධපුරය, කන්තරෝදය, රිදියගම, අකුරුගොඩ ආදි ජනාවාසවලින් හා ඉබ්බන්කටුව, පිංවැව ගල් සොහොන් කනත්ත යන ස්ථානවල පියන්ගල් ඇසුරිනි. පිංවැව ගල් සොහොන් කනත්තේ පමණක් ඒ සංකේත 40ක් හඳුනාගෙන ඇත (Senanayake : 1997). එසේ ම ලංකාවේ විවිධ ස්ථානවලින් හමු වූ කාලරක්ත වර්ණ මැටි මෙවලම්වල තවත් සංකේත 8ක් පමණ වාර්තා වී ඇත (බිනරගම : 2008). ඒවා ජ්‍යාමිතික ය, වෘත්තාකාර ය, ත්‍රිකෝණාකාර ය. ඒවා පූර්ව කාලයේ පහළ වුණු (ප්‍රාග් ඓතිහාසික) සංකේත හා සමාන වන බව ප්‍රත්‍යක්ෂ ය.

## මූලඓතිහාසික යුගයට අයත් ස්ථානවලින් හමුවන සන්නිවේදන සංකේත

ඉබ්බන්කටුව

රිදියගම

අනුරාධපුර ඇතුළු නුවර

රිදියගම


අනුරාධපුර ඇතුළු නුවර

රිදියගම

අනුරාධපුර ඇතුළු නුවර


රිදියගම

අනුරාධපුර ඇතුළු නුවර





(Senevirathne: 1984; බණ්ඩාර: 2002)

මේ ආකාරයට මූලඓතිහාසික සංස්කෘතියේ විවිධ ප්‍රදේශ ආශ්‍රයෙන් පැවැති ජනාවාසවල සමාන ලක්ෂණ තිබීමෙන් ගම්‍ය වන්නේ මේවා බොහෝ විට තොරතුරු සන්නිවේදනය සඳහා ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් සංකේත භාවිත කරන්නට ඇතැයි යන්න ය. ප්‍රාග් ඓතිහාසික ගුහා සංකේත සමඟ මේ මූල ඓතිහාසික සංකේත සැසඳුව හොත් එය ඒවා තුළ යම් ඒකාබද්ධතාවක් දැකගත හැකි ය.

| ප්‍රාග්ඓතිහාසික සන්නිවේදන සංකේත | | මූලඓතිහාසික සන්නිවේදන සංකේත | |
|---|---|---|---|
| තන්තිරිමලේ |  | ඉබ්බන්කටුව/ රිදියගම |  |
| තන්තිරිමලේ |  | අනුරාධපුර |  |
| ගොනාගොල්ල |  | අනුරාධපුර/රිදියගම |  |
| කොනත්තේගොඩ |  | අනුරාධපුර/රිදියගම |  |
| බුදුගල්ගේ |  | අනුරපුර |  |

මේ හැඩැති සංකේත ඉන්දියාවේ මූලඓතිහාසික සංකේත හා සැසඳෙයි.




| ලංකාවේ මූල ඓතිහාසික සංකේත | | ඉන්දියාවේ මූල ඓතිහාසික සංකේත |
|---|---|---|
| කොල්ලන්නත්ත |  |  |
| පොම්පරිප්පු |  |  |
| අනුරාධපුර ඇතුළුනුවර |  |  |
| අනුරාධපුර |  |  |
| රිදීගම/අනුරාධපුරය |  |  |
| අනුරාධපුරය |  |  |

මෙයින් පැහැදිලි වන්නේ මේ දෙපළාත් අතර යම් අඛණ්ඩ සමාජ සම්බන්ධතාවක් පැවතුණු බවයි.






අනුරාධපුර ඇතුළුපුරයේ සිදුකරන ලද කැනීම්වල දී හමු වුණු ප්‍රාථමික යකඩ සමයට (Early Iron Age) සම්බන්ධ කාලරක්ත වර්ණ මැටි බඳුන් කැබලි කිහිපයක කාලනිර්ණ ලැබී ඇත්තේ ක්‍රි. පූ. 6-5 වන සියවස කාලයට ය. එහි අන්තර්ගත බ්‍රාහ්මී අක්ෂර "බිය අනුරද" හා "තයා කුටේ" යනුවෙන් කියවිය හැකි ය (Deraniyagala :1992). එසේ නම්, මූලඓතිහාසික ජ්‍යාමිතික සංකේත ක්‍රි. පූ. 600 - 500 සමයට අයත් අක්ෂරය බවට පරිවර්තනය වී තිබුණ බව පැහැදිලි ය. එසේ ම අනුරාධ නැමැති නාමය මුල් ම ග්‍රාම පිහිටුවීම හා සම්බන්ධ ව පවතින සංඥා නාමයකි.

## ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධිය හා සංකේත පරිණාමය

නිශ්චිත වශයෙන් ම ශිලා ලේඛන ආරම්භ වූ වකවානුව මුල් ඓතිහාසික අවධිය වශයෙන් පිළි ගැනේ (සෙනෙවිරත්න : 1996). ක්‍රි. පූ. 300 - ක්‍රි. ව. 100 කාලයට අයත් වන සමයේ දී දිවයින පුරා අභිලේඛන 1200කට වඩා වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත (Paranavitana: 1970). මෙයින් ඇතැම් ලිපිවල යම් සංකේත ද වෙයි. මෙයින් පැහැදිලි වන්නේ මේවා ඉහත දැක්වුණු පියන්ගල්වල හා කාලරක්ත වර්ණ මැටි මෙවලම්වල පෙනෙන සංකේතවලට සමාන බවයි. එසේ ම, පරුමක, ගහපති, ගමික, බත, බරත, අෂ, කුටුබික ආදීන් ඇතුළු ජන කණ්ඩායම් මූලඓතිහාසික සමය හා සම්බන්ධ වූවන් බවයි (සෙනෙවිරත්න : 1996). එසේ ම ඔවුන්ගේ ලෙන් ලිපිවල පසෙකින් අක්ෂර නොවන සංකේත සටහන් කෙළේ තමන්ගේ පදවිය, තම කුලය හෝ වංශය පිළිබඳ කරුණු පෙන්වීමේ අදහසකින් බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දෙයි (සෙනෙවිරත්න : 1996). මෙයින් පැහැදිලි වන්නේ මෙවැනි සංකේත බොහොමයක් මඟින් අඛණ්ඩ සමාජ පසුබිම පැහැදිලි වන බවයි. මූල හා මුල් ඓතිහාසික අවධිවලට අයත් සංකේත අතර යම් අන්‍යෝන්‍ය සහ සම්බන්ධතාවන් පවතින බව මෙසේ පෙන්විය හැකි ය.



| මූල ඓතිහාසික සංකේත | | මුල් ඓතිහාසික ශිලාලිපිවල ඇති සංකේත | |
|---|---|---|---|
| අනුරාධපුරය |  | රිටිගල |  |
| අනුරාධපුර/පොම්පරිප්පුව |  | රිටිගල |  |
| අනුරාධපුර/රිදීගම |  | අනුරාධපුරය |  |
| රිදීගම |  | සිතුල්පව්ව |  |
| අනුරාධපුර/කන්තරෝදය |  | අනුරාධපුර |  |
| පොම්පරිප්පුව |  | පරමාකන්ද |  |
| අනුරාධපුර |  | මිහින්තලේ |  |
| අනුරාධපුර |  | රිටිගල |  |

(Seneviratne 1984; බණ්ඩාර: 2002)

| ප්‍රාග් ඓතිහාසික යුගය | | මූල ඓතිහාසික යුගය | මුල් ඓතිහාසික යුගය | |
|---|---|---|---|---|
| තන්තිරිමලේ |  |  | මිහින්තලේ |  |
| තන්තිරිමලේ |  |  | කන්දේගමකන්ද |  |
| ගොනාගොල්ල |  |  | අනුරාධපුර |  |
| කොනන්තෝගොඩ |  |  | | |
| තන්තිරිමලේ |  |  | පිච්චන්දියාව |  |
| බුදුගල |  |  | ගල්ලෙන විහාරය |  |

(Seneviratne :1984)

තව ද, වාණිජ කටයුතු හා මේ සංකේත සම්බන්ධ වූ බව ද දැන් පැහැදිලි වේ. ලංකාවේ හමු වී ඇති හස්එබු, ස්වස්තික, ලක්ෂ්මී ආදී කාසි බොහොමයක මේ සංකේතවලට සමාන සංකේත මෙහි දැකගත හැකි වෙයි. මේ පිළිබඳ ව අවධානය කර ඇති පී. ඊ. පී. ප්‍රනාන්දු පවසන්නේ මේවා ඉන්දීය හා දේශීය බ්‍රාහ්මී අක්ෂර රූපවලට වඩා වෙනස්කම් හා සමානකම් පවතින බැවින් සිංහල අක්ෂරවල සම්භවය ක්‍රි. පූ. 600 - 500 දක්වා අතීතයට විහිදෙන බව ය (ප්‍රනාන්දු 1969). විශේෂයෙන් බ්‍රාහ්මී අක්ෂරවල දැකගත හැකි හැඩතල අක්ෂර නොවන සංකේතවල පවතින ආකාරය පහත සඳහන් වගුව අනුව පෙනෙයි.

| සිංහල | බ්‍රාහ්මී | බ්‍රාහ්මී නොවන සංකේත | |
|---|---|---|---|
| ම |  | අනුරාධපුර/ රිදියගම |  |
| බ |  | ඉබ්බන්කට්ටුව |  |
| ය |  | රිදියගම |  |
| ත |  | අනුරාධපුර/ රිදියගම |  |
| හ |  | අනුරාධපුර |  |
| ව |  | අනුරාධපුර |  |
| ශ |  | රිදියගම |  |

# ආශ්‍රය ග්‍රන්ථ හා ලිපි නාමාවලිය


දැරණියගල, එස්.

1986 ආදි මානවයන්ගේ රහස් හෙළි වේ, ***සිළුමිණ ශාස්ත්‍රීය අතිරේකය*** (1986 ඔක්තෝබර් 12 -19)

පීරිස්, එම්.

2002 ***පැරණි මිසරය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

ප්‍රනාන්දු, පී. ඊ. පී.

1964 ***සිංහල අක්ෂර මාලාවේ ආරම්භය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සියවස***, සංස්කෘතික අමාත්‍යංශය, කොළඹ

බිනරගම, ඩී.

2008 ***ශ්‍රී ලංකාවේ ප්‍රාථමික චිත්‍ර කලාව හා ප්‍රාථමික ලේඛන කලාව***, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

බණ්ඩාර, ටී.

2002 හම්බන්තොට ආශ්‍රිත ඓතිහාසික පුරාවිද්‍යාව, ***වැලිපිළ***, 05 වන කලාපය, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල

මැන්දිස්, ටී.

2004 සංකේත මගින් පිළිඹිබු වන ශ්‍රී ලංකාවේ අඛණ්ඩ සමාජ සම්බන්ධතාව, ***දිවයින බදාදා අතිරේක*** 2004.07.21

සෙනෙවිරත්න, එස්.

1996 උත්තර මලය රට ප්‍රාථමික යකඩ යුගයේ ඛනිජ සම්පත් පරිහරණ ඓතිහාසික පුරාවිද්‍යාව, ***ඓතිහාසික මහනුවර ශ්‍රී සුමංගල විද්‍යාලයීය බෞද්ධ පදනම***

1996 ***පර්යන්ත ප්‍රදේශ හා ආන්තික ප්‍රජාවේ මුල් අයස් සමයේ ද්‍රව්‍ය හා සමාජ නැඟුම පිළිබඳ විකල්ප හේතු***, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

Buler, G

1962 ***Indian Paleography, Culcotta Indian Studies***, Culcotta

Bandaranayake, S.

1986 ***The Rock Art and Wall Painting of Sri Lanka***, Colombo